# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1840/9 - 2013 දෙසැම්බර් මස 09 වැනි සඳුදා - 2013.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

52 වැනි වගන්තිය යටතේ වූ නියමය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 52 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහ විදුලිබල සහ බලශක්ති විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම,

(අ) මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ඉඩම, විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා වහාම අවශ්‍ය වන බව ; සහ

(ආ) එකී විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, මහජන කාර්යයක් වන බැවින් මහජනතාවගේ පොදු සුභ සාධනය සහ ප්‍රතිලාභය සඳහා ඉවහල් වන බව

අදහස් කරන හෙයින්, එකී ඉඩම එම කාර්යය සඳහා අවශ්‍ය වන බවට මෙම නියෝගයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

*ඉඩමේ මායිම්*

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බටවල (වසම අංක 450) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බටවල ග්‍රාමයේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු යූ. කේ. ජී. ප්‍රසාද් එස්. පුෂ්පකුමාර විසින් පිළියෙල කරන ලද 2013.09.27 දිනැති අංක 2641 දරන පිඹුරේ කැබලි 1 ලෙස නිරූපනය කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 13 රූඩ් 01 පර්චස් 18.75ක් වූ ඉඩම සහ කැබලි 2 ලෙස නිරූපනය කර ඇත්තා වූ ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 03 පර්චස් 37.83 ක් වූ ඉඩම සඳහා වූ මායිම් පහත දැක්වෙන පරිදි වේ :-

1A - G 18697 — 200 (2013/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

01. *කැබලි අංක 1 සඳහා වූ මායිම්*

| | | |
|---|---|---|
| *උතුරට* | : | පුවක්ගහ කුඹුර සහ බටවල පුරාණ විහාර භූමිය ; |
| *නැගෙනහිරට* | : | බටවල පාර, වරිපනම් අංක 136, 138, 140, 140/2/1, 140/2/2 සහ 140/2/3 සහිත ඉඩම් සහ චන්ද්‍ර සුදසිංහ සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | පාර ; |
| *බටහිරට* | : | ගල්පොත්තේ කුඹුර සහ පුවක්ගහ කුඹුර. |
| ප්‍රමාණය | : | අක්කර 13 රූඩ් 01 පර්චස් 18.75 |
| හිමිකම් කියනු ලබනුයේ | : | ලියන ආරච්චිගේ චම්පිකා සඳමාලි, හැලඹ ආරච්චිගේ සුසන්ත ප්‍රේමලාල්, සුබසිංහ මානගේ පියසේන, බෙන්තර බඩල්ගේ ජයලත්, බියගම ආචාරිගේ ලලනි, විතානගේ දොන් ගුණසේකර, හේවාගමගේ ඉන්ද්‍රා විජේපාල, සුදසිංහගේ ජගත් චින්තක සහ තවත් අය. |

02. *කැබලි අංක 2 සඳහා වූ මායිම්*

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර ; |
| *නැගෙනහිරට* | : | වරිපනම් අංක 140/1 සහ 142/A/1 සහිත ඉඩම් ; |
| *දකුණට* | : | පාර සහ නන්දසේන හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | ගල්පොත්තේ කුඹුර. |
| ප්‍රමාණය | : | අක්කර 01 රූඩ් 03 පර්චස් 37.83 |
| හිමිකම් කියනු ලබනුයේ | : | හැලඹ ආරච්චිගේ සුසන්ත ප්‍රේමලාල්, අජිත් සහ තවත් අය. |

12-1012

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.